# මහනුවර දළදා මාළිගාවේ අප්‍රකට දියවඩන නිලමේවරු කිහිප දෙනෙක් (ක්‍රි.ව. 1733-1814) පිළිබඳ තුඩපත් ආශ්‍රිත අධ්‍යයනයක්

**උදය නෙලුම් රත්නායක**

සහය කථිකාචාර්ය (ඉතිහාසය), ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ
nelukit@yahoo.com

## හැඳින්වීම

දළදා වහන්සේගේ භාරකාරත්වය හිමි උතුම් ගිහි පුද්ගලයා වනුයේ දියවඩන නිලමේවරයා ය. මෙම තනතුරෙහි ප්‍රභවය මහනුවර යුගයේ දි සිදු වූ බව බොහෝ අවස්ථාවල පිළිගන්නා මතය වේ. දළදා මාළිගාවේ මෙකී තනතුර හෙබ වූ නිලමේවරු පිළිබඳ අඛණ්ඩ වාර්තාවක් නිශ්චිත වශයෙන් ඉදිරිපත්කර ඇත්තේ ක්‍රි.ව. 1814න් පසුව ය. නමුත් දළදා වහන්සේ ලක්දිවට වැඩම කර වූ අවස්ථාවේ සිට මහනුවර යුගය දක්වා දියවඩන නිලමේ තනතුර හඳුන්වා දී තිබුණේ ද යන්නත් එ සේ නො වී නම් ඒ කටයුත්ත භාර යම් නිලධාරියෙකු සිටියේ ද යන්නත් ක්‍රි.ව. 1814ට පෙර දළදා මාළිගාවේ මෙකී තනතුර හෙබ වු යම් පිරිසක් සිටියේ ද යන ගැටලු මේ සම්බන්ධයෙන් නිතැතින් ම මතු වේ. දළදා වහන්සේ සම්බන්ධයෙන් වංශකතා සාහිත්‍යයක් දීර්ඝ වශයෙන් ගොඩනැංවී ඇති නමුත් දියවඩන නිලමේ තනතුර හා එහි ඓතිහාසික තොරතුරු සම්බන්ධයෙන් එ බඳු අඛණ්ඩ ඉතිහාසයක් වාර්තා වී නොමැත. එ බැවින් මෙම අධ්‍යයනයේ දී දළදා මාළිගාවේ දළදා වහන්සේ සම්බන්ධ ව ගිහි භාරකත්වය හෙබ වූ දියවඩන නිලමේ තනතුරේ සැග ව ගිය ඓතිහාසික තොරතුරු කිහිපයක් අනාවරණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. එහි දී විශේෂයෙන් ක්‍රි.ව. 1814ට පසුව වර්තමානය දක්වා මෙම තනතුර හොබවන නිලධාරීන් පිළිබඳ කිසිදු අපහසුතාවකින් තොර ව තොරතුරු අනාවරණය කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබෙන බැවින් මෙම අධ්‍යයනයේ දී ක්‍රි.ව. 1814ට පෙර අවධියේ මෙකී තනතුර හෙඹ වු නිලමේවරු කිහිප දෙනෙකු හෝ අනාවරණය කර ගැනීමට අපේක්ෂා කෙරේ.

## අන්තර්ගතය

ක්‍රි.පු. තුන් වැනි සියවසේ දී ථෙරවාදී බුදුදහම මෙ රටට හිඳුන්වා දීමෙන් අනතුරු ව ශ්‍රී මහා බෝධි රෝපණය හා දළදා වහන්සේ ලංකාවට වැඩම කරවීම ඓතිහාසික වැදගත්කමින් යුක්ත සිදුවීම් ලෙසින් පෙළ ගැසේ. ශ්‍රී මහා බෝධියටත් වඩා මෙරට සංස්කෘතික, ආගමික ක්ෂේත්‍රයන් හැරුණු කොට දේශපාලන ක්ෂේත්‍රයට ද දළදා වහන්සේගේ භාරකාරත්වය සම්බන්ධයෙන් විශේෂ වැදගත්කමක් හිමි වු බව මෙරට ඉතිහාසය හැදෑරීමෙන් පැහැදිලි වේ. ක්‍රිව හතර වැනි සියවස ආරම්භක වසර කිහිපයේ දී මෙ රට පාලක සිරි මේඝවර්ණ රජ සමයේ දී දළදාව ලක්දිවට වැඩම කළ බව වංශකතා සාහිත්‍යයේ සඳහන් වේ. ඉන් පසුව දළදා වහන්සේ හුදෙක් පූජ්‍ය වස්තුවකට පමණක් සීමා නොවී එය වටා අභිමානවත් සංස්කෘතික දායාදයන් හා වත් පිළිවෙත් සම්ප්‍රදායක් නිර්මාණය විය.

වර්තමානයේ දළදාව භාරකාර පුද්ගලයා දියවඩන නිලමේ යන ගෞරවනීය නාමයෙන් හඳුන්වන අතර මෙහි වචනාර්ථය පුළුල් අර්ථකථනයක් සඳහා පූර්ව කතිකාවක් සපයන පදයක් යැයි ඒ පිළිබඳ අර්ථ විග්‍රහයෙන් පැහැදිලි වේ. කෘෂිකාර්මික ආර්ථිකයක් ක්‍රියාත්මක වන පෙරදිග රාජ්‍යයක් වශයෙන් ලංකාව කලට වේලාවට වර්ෂාව අපේක්ෂා කළ දිවයිනකි. එ බැවින් ඒ ආශ්‍රිත පූජ්‍ය වස්තුව දළදාව වු බැවින් මෙකී අර්ථ නාමය සකස් වී යැයි සාමාන්‍යයෙන් පිළි ගැනේ. එහි දී අතීතයේ සිට දළදාව වර්ෂාව ලබාදෙන මහාර්ඝ වස්තුවක් වූ බැවින් එකී උත්සව සංවිධානය කිරීමට ගිහි හෝ පැවිදි නිලධාරියෙකු එම කාර්ය ඉටුකරන්නට ඇති නමුත් මුල් කාලීන

අතීතයේ ඔහු කවරෙක් වුයේ ද යන්න නිශ්චිත ව නොදැක් වේ. තනතුරේ කාර්යන් එ ලෙසින් ම ඉටු කළේ ද යන්නත් යම් ආකාරයකට අවිනිශ්චිත ය.

දියවඩන නිලමේ තනතුරේ ආරම්භය පිළිබඳ පැහැදිලි මුලාශ්‍රය සාධක ඉතා විරල ය. මෙම තනතුර පිළිබඳ පැහැදිලි ලෙස මුල් වරට තොරතුරු ලැබෙනුයේ කෝට්ටේ අවධියේ කීරවැල්ල රජ පරපුරට අයත් හිරිපිටියේ රාළ සම්බන්ධයෙනි. පෘගුගීසින්ගේ ආගමනයත් සමග බෞද්ධ විරෝධී ක්‍රියා උග්‍ර වු බැවින් දළදාවේ ආරක්ෂාව පිළිබිඳ වගකීම ඔහු වෙත පැවරූ බව සමකාලීන මුලාශ්‍ර දක්වයි. සීතාවක රාජ්‍ය සමයේ දී ද ඔහු හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයෙකු විසින් දළදාවේ භාරකාරත්වය දරා ඇතැයි සැලකිය හැකි ය. මොහු වත්මන් දියවඩන නිලමේ

මහනුවර අවධිය වනවිට දියවඩන නිලමේ තනතුර එකී නාමයෙන් ම පැවති බව මන්දාරම්පුර පුවතේ පැහැදිලි වේ. එහි දී දළදාව පමණක් නොව මාළිගාවේ වෙනත් කටයුතු ද පැවරී තිබු නිසා එම තනතුර කිහිපදෙනෙකු විසින එකවර දැරූ බවත් එකී කාර්යයන් එකිනෙකට වෙනස් වු බවත් පැහැදිලි වේ. නමුත් දළදා මාළිගාවේ දියවඩන නිලමේ යන තනතුර දළදාව සඳහා කාර්ය පැවරූ තනතුරු දැරූ අයට පමණක් ව්‍යවහාර කර ඇත. එහි දී වතාවත් නිසි ලෙස පැවත්වීමත් මාළිගාවේ පරිපාලනයත් එම තනතුර යටතේ තවදුරටත් භාර දී තිබිණි.

| හඳුනාගත් දියවඩන නිලමේ වරයා | තුඩපල තහි සදහන් වර්ෂය | තුඩපත | සමකාලීන රාජ්‍ය පාලකයා |
|---|---|---|---|
| වික්‍රමසිංහ පණ්ඩිත මුදියන්සේ | 1733<br><br>1737<br>1738 | කොඩිතුවක්කු මුහන්දිරම්ගේ තුඩපත<br>වීරවර්ධන මහුන්දිරම් තුඩපත<br>හල්ගල්පාළුවේ තුඩපත | ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (ක්‍රිව 1707-1739) |
| විජයවර්ධන අමෘත හස්ත නවරත්න පණ්ඩිත මුදියන්සේ | 1742 | පල්ලේ ඇඹිලිපිටියේ තුඩපත | ශ්‍රී විජය රාජසිංහ (ක්‍රිව 1739-1747) |
| මුත්වත්තේ රාජකරුණා විජයවර්ධන නවරත්න මහමුදියන්සේ | 1761 | සිරිවර්ධන අභයකෝන් විජයසුන්දර අප්පුගේ තුඩපත | කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රිව 1747-1781) |
| අගම්මන දිවාකාර රාජපක්ෂ වාසල මුදියන්සේ | 1780 | මඩලගම තුඩපත | කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රිව 1747-1781) |
| පිළිමතලාවේ විජයසුන්දර රාජකරුණා නවරත්න අත්තනායක බණ්ඩාරනායක මුදියන්සේ | 1787 | මාරගල ගල්ලෙනෙගොඩ විහාර තුඩපත | රාජාධි රාජසිංහ (ක්‍රිව 1781-1798) |
| පිළිමතලාවේ විජයසුන්දර සෙනෙවිරත්න අභයකෝන් පණ්ඩිත මුදියන්සේ | 1806 | ඇත්තලවත්තේ තුඩපත<br><br>ගබ්බල වීරසිංහ තුඩපත | ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රිව 1798-1815) |
| පිළිමතලාවේ විජයසුන්දර රාජකරුණා නවරත්න අත්තනායක බණ්ඩාරනායක | 1812<br>1814<br>1814<br><br>1814 | පොත්ගුල් විහාර තුඩපත<br>උග්ගල් අළුත් නුවර දේවාල තුඩපත<br>වැලිගේපොළවිදානේ හේනයායගේ තුඩපත<br>වලකුඹුරේගම තුඩපත | ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රිව 1798-1815) |

1815 දී උඩරට ගිවිසුම ප්‍රකාරව සිංහල රාජධානිය බ්‍රිතාන්‍යයන් අතට පත් විය. එහි දී සිංහල රාජාණ්ඩු ක්‍රමය අහෝසි කළ නිසා බොහෝ තනතුරු ප්‍රමාණයක් ඉවත්ව ගොස් තිබෙනමුත් දළදා මාළිගාවේ දියවඩන නිලමේ යන තනතුර එදා සිට අද දක්වා අඛණ්ඩ ව ක්‍රියාත්මක වි ය. එහි දී ඉංග්‍රීසින් පාලන බලය ලබාගැනීමට පෙර පටන් වර්තමානය දක්වා මෙකී තනතුර හෙබ වූ නිලධාරීන් පිළිබඳ අඛණ්ඩ නාම ලේඛනයක් වර්ෂානුක්‍රමයෙන් ඉදිරිපත් කර ඇත. එහි දී දියවඩන නිලමේ පරපුරේ මුල් පුරුක කපුවත්තේ අදිකාරම්වරයා ලෙස පැහැදිලි ව හඳුනාගත හැකි ය. නමුත් මෙම ලේඛනයට ඔබ්බෙන් ද වඩාත් ප්‍රසිද්ධ දියවඩන නිලමේවරුන්ට වඩා ඊට අමතර ව අප්‍රකට ඊට ඈත අතීතයක සිට මෙකී තනතුර දැරූ අප්‍රකට පුද්ගලයන් කිහිපදෙනෙකු පිළිබඳ සමකාලීන තුඩපත් ඇසුරින් අනාවරණය කර ගැනීමට අවස්ථාව ලැබේ. එ නම් ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍ය යටත් වීමට මත්තතෙන් මෙකී තනතුර දැරූ නිලමේවරුන් කිහිපදෙනෙකු පෙළ ගැස්වීමට හැකියාව ලැබේ.

## ක්‍රමවේදය

ඉහත සඳහන් කරන ලද එක් එක් තුඩපත් වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය කිරීම මගින් මෙම නිලමේවරුන් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. එහි දී මෙම තුඩපත් පිළිබඳ තොරතුරු රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පතු හා පැරණි ලියවිලි සම්බන්ධ මූලාශ්‍රය ඇසුරින් ගොනු කිරීමට අපේක්ෂිත ය.

## සමාලෝචනය

දළදා මාළිගාවේ දියවඩන නිලමේවරු පිළිබඳ නිශ්චිත තොරතුරු බ්‍රිතාන්‍ය අවධියේ සිට ඉදිරිපත් වන නමුත් ඉන් ඔබ්බට මෙම තනතුර දැරූ පුද්ගලයන් සිටි බව තුඩපත් ආශ්‍රයෙන් අධ්‍යයනය කළ හැකි ය. එ සේ ම මුල් කාලීන දියවඩන නිලමේවරුන් දළදාව සම්බන්ධ කටයුතුවලට අමතර ව මාළිගාවේ වෙනත් රාජකාරි කටයුතු කිහිපයක ම නියැලුණු බවත් මෙකී අප්‍රකට තනතුරු බොහෝමයක් ඥාතී සම්බන්ධතා මත පත්කර ගත් තනතුරු බවත් පැහැදිලි වේ.

## ආශ්‍රෙය ග්‍රන්ථ


දළදා පූජාවලිය, 1954, පුංචි බණ්ඩාර සන්නස්ගල, සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති සමාගම, කොළඹ.

දළදා සිරිත, 1949, සංස්. වජිරා රත්නපුරිය, ඇපෝතිකරිස් සමාගම, කොළඹ.

අබයසිංහ ටිකිරි, දේවරාජා ශ්‍රීමතී, සෝමරත්න ජී.වී.පී., 1997, උඩරට රාජධානිය (1440-1818), සීමාසහිත ලේකහවුස් ඉන්වෙස්ට්මන්ට්, කොළඹ

ඔබේසේකර මිරැන්ඩෝ., 2004, කන්ද උඩරට සමාජ සංවිධානය හා ප්‍රභූවරු, සමන්ති ප්‍රකාශකයෝ, ජා ඇල

ඤාණවිමල හිමි කිරිඇල්ලේ., 2001, සපරගමුවේ පැරණි ලියවිලි, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ

Hocart A.M, 1931, The Temple of the tooth in Kandy, Memories of the Archaeological Survey of Ceylon

Pieries P.E., 1945, Tri Sinhala: The Last phase (1796-1815), The Colombo Apothecaries, Colombo